# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.11.16

වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 16 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ නොවැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
15. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
16. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u> ඃ-**

**<u>01. 2022-10-04 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-10-04 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-10-04 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022-10-04 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත්කර තිබීම හේතුවෙන් සම්පූර්ණ සභා වාර්තාවට විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 09.50ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සහ පෙ.ව 09.55ට ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

2022-10-04 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව බහුතරයෙන් සභා සම්මත විය.

**02. 2022-10-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-10-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-10-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022-10-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත්කර තිබීම හේතුවෙන් සම්පූර්ණ සභා වාර්තාවට විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2022-10-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව බහුතරයෙන් සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් විශේෂ නිවේදන යටතේ මෙම සභා වාරයේ ඉදිරිපත් කරනු ලබන අවසාන අයවැය අද දින මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන බවත්, ලේකම් අනිල් රංජන් ලමාහේවා මැතිතුමාගේ සේවා කාලය තුළ පවත්වන අවසාන මහා සභා රැස්වීම ද මෙය විය හැකි බවත්, මෙම මස 23 වන දිනට පෙර ලේකම්වරයෙකු ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බවත්, දැනට සිටින ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමාද ජනවාරි මස විශ්‍රාම යාමට ඉල්ලීම් කර ඇති බවත්, ගාල්ල මහා නගර සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි ලෙස සේවය කරනු ලබන සමන්ත බෝපෙ ආරච්චි මහතා අප ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරට පත්කරන ලෙස ඉල්ලීම් කළද එම මහතා ඒ සඳහා එකඟතාවය ලබා දී නොමැති බවත් සභාව අමතා ප්‍රකාශ කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** 2023 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2023 වර්ෂය සඳහා සම්මත කිරීමට යෝජනා කරන ලද අයවැය සම්බන්ධයෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස බල ප්‍රදේශයේ ජනතා අපේක්ෂාවන් ඉටු කරලීම තමාගේ පරම යුතුකමක් වන අතර එම පරමාර්ථය පෙරදැරි කරගෙන 2023 වර්ෂයේ බල ප්‍රදේශයේ සංවර්ධිත ඉලක්කයන් ඇතුළත්ව අයවැය ලේඛනයට මෙසේ සුභ පැතුම් පණිවුඩයක් එක් කිරීමට ලැබීම තමා ලැබූ භාග්‍යයක් ලෙස සලකන බවයි.

පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ පූර්ණ වගකීම වනුයේ ජනතාවගේ සුබ විහරණය හා සුභසාධනය යන සියලු පහසුකම් ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීමට අදාළ සියලු කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වන අතර මෙම කරුණු රාශිය ක්‍රියාවට නැංවීමේදී සිවිල් සමාජය, පුරවැසියන් හා පළාත් පාලන ආයතන අතර සබැඳියාවක් නිර්මාණයවීම නිරන්තරයෙන් ගත හැකි අතර මෙම සබැඳියාවන් වඩාත් ගුණාත්මකබවින් හා කාර්යක්ෂමතාවයෙන් වර්ධනය කිරීම තමාගේ මෙන්ම උපසභාපතිතුමා ඇතුළුව සහෝදර මන්ත්‍රී මණ්ඩලයේ වගකීම හා යුතුකම වන බවයි.

මෙම අරමුණු පෙරදැරි කර ගනිමින් 2023 අයවැය තුළින් සභා බල ප්‍රදේශය තුළ දියුණු මංමාවත් පද්ධතියක් ඇති කිරීම, බල ප්‍රදේශයේ ජනතාව නීරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත් කිරීම උදෙසා සෞඛ්‍ය පහසුකම් නංවාලීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් නොකඩවා සිදු කරගෙන යාම, වීථි ආලෝකකරණය, සුභසාධක පහසුකම් නංවාලීම සහ කාබනික පොහොර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගයක් වශයෙන් සහා බල ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට සහ ගෙවතු වගාවේ නියුතු ජනතාවට පොහොර මලු සහන මිලට ලබා දීම ප්‍රධාන පරමාර්ථය වන බවයි.

රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ වුවද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව වෙත ඉටුවිය යුතු සේවය අඛණ්ඩව සැපයීම සඳහා කටයුතු කරමින් ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති වන කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල සහ සිට්‍රුස් වත්ත ආදාහනාගාරය ඉදිකිරීමට මූලිකත්වය ලබා දීමට හැකිවීම තමා ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් බවත්, එමගින් සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ජීවන තත්වයන් තවදුරටත් නගා සිටුවීමත් දක්ෂිණ අභිමානවත් නවමු පුරවරයක් බවට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පත් කිරීමත් තමාගේ පරම සහ ඒකායන බලාපොරොත්තුව වන බවයි.

මෙම අයවැය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබාදීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා, දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ඇතුළු ආයතනවලින් ලැබෙන සහයෝගය අගය කරන අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තමාගේ ස්තුතිය පුද කරන ලදී.

එමෙන්ම ගරු උපසභාපති සුමිත් ජයසේකර මැතිතුමා ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කරන අතර ඔබ සැමට සෞභාග්‍යයෙන් පිරුණු නිරෝගී සාමකාමී නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

**<u>වැඩසටහන 01 පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා</u>**

සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල, කාර්යය හා යුතුකම් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා සමස්ත කාර්ය මණ්ඩල මෙහෙයවීම හා පාලනය, සභාවේ අරමුදල් පාලනය කිරීම හා සභාව වෙත අයවිය යුතු ආදායම් එකතු කර ගැනීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වන බවත්, සභාවේ සියළුම පරිපාලන හා විධායක කාර්යයන් සිදු කිරීමද, සභාවේ සෑම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් ක්‍රියා කිරීමද, ගිණුම් කටයුතු නිවැරදිව පවත්වාගෙන යාම හා අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමද මෙම වැඩසටහනින් බලාපොරොත්තු වන අතර ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාලයකින් සමන්විත වන අතර මෙම වැඩසටහන යටතේ ප්‍රධාන ආදායම් මූලාශ ලෙස වරිපනම් බදු, පාපැදි බලපත්‍ර ගාස්තු, වීථිරේඛා ගාස්තු, වරිපනම් සංශෝධන ගාස්තු, උසාවි දඩ, ස්ථාවර තැන්පත් පොළී හා සේවක ණය පොළී, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම, වෙන්දේසි හා විකිණුම් ආදායම්, වෙනත් ආදායම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවට පැහැදිලි කරන ලද අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර වශයෙන් කාර්ය මණ්ඩල හා සභික වැටුප් හා දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිළදී ගැනීම, ඉන්ධන වියදම්, කැබ් රථ හා ත්‍රී රෝද රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව, ජල, විදුලි, දුරකථන හා මුද්‍රණ වියදම්, නිල ඇඳුම් වියදම්, සංග්‍රහ හා වෙනත් වියදම්, වියදම් කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කරන ලදී.

**<u>වැඩසටහන අංක 2 - සෞඛ්‍ය සේවා</u>**

ජනතා සුබ විහරණය සඳහා අත්‍යාවශ්‍ය සේවාවක් වන සෞඛ්‍ය පහසුකම් සපුරාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව ප්‍රදේශය තුළ ජනනය වන කැළි කසළ ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කිරීම, බෝවන රෝග, වසංගත හා සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයන් නැති කිරීම හා ආයුර්වේද වෛද්‍ය සේවා පවත්වාගෙන යාම මෙමගින් බලාපොරොත්තු වේ. එසේම ආහාර පනත ක්‍රියාත්මක කරවීම තුළින් ප්‍රමිතකරණයෙන් තොර ආහාර පරිභෝජනය වැලැක්වීමට කටයුතු කරන අතර, පරිසර අධිකාරියේ මඟපෙන්වීම යටතේ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමටද කටයුතු කරනු ඇති අතර, මෙම වැඩසටහන යටතේ ඇති ආයතන වන්නේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයීය ආයුර්වේද බෙහෙත් ශාලාව, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා උප කාර්යාලයීය ආයුර්වේද බෙහෙත් ශාලාව, උක්වත්ත හා මහ හපුගල සායන වන අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන්නේ වෙළඳ බලපත්‍ර ගාස්තු, පරිසර බලපත්‍ර ගාස්තු, පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු, කසළ රැස්කිරීමේ ගාස්තු, සුසාන භූමි ගාස්තු, කසළ බඳුන් විකිණුම් ආදායම, සෞඛ්‍ය ආධාර, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම, ණය ලැබීම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවට පැහැදිලි කරන ලද අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර වන්නේ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ මිළදී ගැනීම, ඉන්ධන වියදම්, ට්‍රැක්ටර්, ටේලර්, ඩම්ප් ට්‍රක් හා කම්පැක්ටර් රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව, ජල, විදුලි හා දුරකථන වියදම්, නිල ඇඳුම් වියදම්, කසළ ව්‍යාපෘතියේ ගාස්තු, ඩෙංගු මර්ධන හා වෙනත් වියදම්, ණය හා පොළී ගෙවීම වියදම් කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කරන ලදී.

## වැඩසටහන අංක 3 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි

ප්‍රාදේශීය සභාව සතු ඉඩම්, ගොඩනැගිලි හා මංමාවත් පවත්වාගෙන යාමත්, අළුත්වැඩියාව හා අළුතින් එකතු කිරීමේ කටයුතු ද ඇතුළුව ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය භෞතික පහසුකම් සපුරාලීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙම වැඩසටහන යටතේ නගර නිර්මාණය, අලුතින් මාර්ග තැනීම, නොදියුණු මාර්ග දියුණු කිරීම්, කාණු හා බෝක්කු ඉදිකිරීම් හා නඩත්තුව තුළින් ක්‍රමානුකූල ජල පරිවහනයක් ඇති කිරීම ආදී සේවාවන් ක්‍රියාත්මක කරනු ලබන අතර නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසිවලට යටත්ව නීත්‍යානුකූලව හා මහජන සෞඛ්‍ය ආරක්ෂා වන අන්දමට සැකසුන නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා උපදේශන සේවා සැපයීම, මග පෙන්වීම් සිදු කිරීම සහ නිවාස හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමද මෙම වැඩසටහන යටතේ සිදු කරන බවත්, මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන්නේ 1% බදු, අනුකූලතා සහතික ගාස්තු, පෙරසැරි ගාස්තු, ඉඩම් හා ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු, ගොඩනැගිලි දඩ, ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු, දැන්වීම් පුවරු ආදායම හා වෙනත් ආදායම්, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම, මූලධන ලැබීම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවට පැහැදිලි කරන ලද අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර වන්නේ, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම, ඉන්ධන වියදම්, බැකෝ යන්ත්‍රයේ හා අනෙකුත් යන්ත්‍ර අළුත්වැඩියාව හා නඩත්තුව, ජල, විදුලි හා දුරකථන වියදම්, නිල ඇඳුම් වියදම්, ප්‍රීමික්ස් ව්‍යාපෘතියේ වියදම්, ප්‍රාග්ධන හෝ සංවර්ධන වැය, වෙනත් වියදම්, වියදම් කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කරන ලදී.

## වැඩසටහන අංක 5 - වෙනත් උපයෝගීතා සේවා

ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගැනීමේදී අත්‍යවශ්‍ය වන සේවාවන් සැපයීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. ඒ අනුව පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම හා කළමනාකරණ කිරීම තුලින් ප්‍රාදේශීය ආර්ථිකය වැඩි දියුණු කිරීම, වීථි පහන් සවි කිරීම හා නඩත්තුව, පොදු නාන ස්ථාන පවත්වාගෙන යාම මෙම වැඩසටහන තුලින් බලාපොරොත්තු වන බවත්, මෙම වැඩසටහන යටතේ ඇති ආයතන වන්නේ, හපුගල ජන සභා ගොඩනැගිල්ල, ලබුදුව වෙළඳ සංකීර්ණය, කලේගාන මහජන පොළ, පෝද්දල කඩකාමර ගොඩනැගිල්ල, පළිවතුගොඩ ප්‍රජාශාලාව, වටරැක ප්‍රජාශාලාව වන අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන්නේ, කඩකුලී, කඩකුලී දඩ, පොළ ගාස්තු, මස් කඩ ගාස්තු හා දඩ, බදු ගාස්තු හා කුලියට දීමේ ගාස්තු, සත්ව ඝාතන බලපත්‍ර ගාස්තු, ජල ගාස්තු හා ජල බවුසර් ගාස්තු, වීථි පහන් විකිණුම් ආදායම, වීථි පහන් ආධාර, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ලබා ගැනීමට අපේක්ෂා කරන බවට පැහැදිලි කරන ලද අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර වන්නේ, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීම, ඉන්ධන වියදම්, කෘ කැබ් රථයේ අළුත්වැඩියාව හා නඩත්තුව, ජල, විදුලි හා දුරකථන වියදම්, නිල ඇඳුම් වියදම්, වීථි පහන් අළුත්වැඩියාව හා නඩත්තුව, වෙනත් වියදම්, වියදම් කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කරන ලදී.

## වැඩසටහන අංක 6 - සුභ සාධක සේවා

මහජන සුභ සාධනය වර්ධනය කිරීමට ඉවහල් වන අයුරින් දැනුම, අවබෝධය හා අන්‍යෝන්‍ය එකමුතුකම වර්ධනය කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව පුස්තකාල හා ප්‍රජා ශාලා සේවාවන් පවත්වාගෙන යාම, ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා ක්‍රීඩා භූමි ඉදිකිරීම හා නඩත්තු කිරීම, ළදරු අධ්‍යාපනය සඳහා පෙර පාසල් පවත්වාගෙන යාම හා පාලනය කිරීම, ප්‍රදේශයේ ළිං, පොකුණු ඉදිකිරීම හා නඩත්තු කිරීම ආදී සේවාවන් මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම වැඩසටහන යටතේ ඇති ආයතන වන්නේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයීය පුස්තකාලය, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා උප කාර්යාලයීය පුස්තකාලය, කලේගාන අරුණළු, හිරිඹුරගම සුමුදු පෙරපාසල, පෝද්දල ක්‍රීඩාංගනය, ලබුදුව ක්‍රීඩාංගනය, හපුගල ක්‍රීඩාංගනය වන අතර මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වන්නේ විනෝද බදු, ප්‍රසිද්ධ ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තු, නැණසල සේවා ගාස්තු, පුස්තකාල ආදායම්, පුවත්පත් විකිණුම් ආදායම, පුස්තකාල ආධාර, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම වන බවත්, මෙම වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වියදම් මූලාශ්‍ර වන්නේ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, පුවත්පත් හා උපකරණ මිලදීගැනීම, පොත් බැඳීම් ගාස්තු, පොත් හා ලී බඩු මිලදී ගැනීම, ජල, විදුලි හා දුරකථන වියදම්, වෙනත් වියදම්, වියදම් කිරීමට බලාපොරොත්තු බවන බවයි.

ඒ අනුව 2023 වර්ෂය සඳහා තුලිත අයවැය ලේඛනයක් ඉදිරිපත් කරමින් ප්‍රථම වතාවට රුපියල් ලක්ෂ පහක මුදලක් හදිසි ආපදා තත්ත්වයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට වෙන්කොට ඇති බවට ප්‍රකාශ කොට 2023 වර්ෂයට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ අයවැය සාරාංශය ඉදිරිපත් කරන ලදී.

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු ආදායම - රු. 272,671,000.00**

**පුනරාවර්තන ආදායම** රු. **185,971,000.00**

**ප්‍රාග්ධන ආදායම** රු. **86,700,000.00**

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන ආදායම - රු. 185,971,000.00**

- වරිපනම් හා බදු 24,110,000
- කුලී 5,080,000
- බලපත්‍ර ගාස්තු 961,000
- සේවා සඳහා ගාස්තු 8,716,000
- වරෙන්තු ගාස්තු හා දඩ 1,615,000
- වෙනත් ආදායම් 71,570,000
- ආදායම් ආධාර 73,919,000

**185,971,000**

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන ආදායම - රු. 86,700,000**

- ප්‍රාග්ධන ආධාර 36,700,000
- ණය ලැබීම් 50,000,000

**86,700,000**

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු වියදම - රු. 272,671,000.00**

**පුනරාවර්තන වියදම** රු. **130,621,000**

**ප්‍රාග්ධන වියදම** රු. **142,050,000**

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්තන වියදම - රු. 130,621,000**

- වැටුප් හා දීමනා 80,626,000
- ගමන් වියදම් 1,721,000
- සැපයුම් හා උපකරණ 21,737,000
- ප්‍රාග්ධන වත්කම් අ.වැ. හා නඩත්තු 9,500,000
- වෙනත් ආවශ්‍යක සේවා 15,773,000
- පොළී ගෙවීම් -

- ආධාර මුදල් හා සහනාධාර 204,000
- විශ්‍රාම වැටුප් 1,060,000

**130,621,000**

**2023 වර්ෂයට අපේක්ෂිත මුළු ප්‍රාග්ධන වියදම - රු. 142,050,000**

- ප්‍රාග්ධන වැය 142,050,000
- ණය ආපසු ගෙවීම් -

**142,050,000**

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ඉතා හදිසි සහ වැදගත් යෝජනාවක් මෙම ගරු සභාපතිතුමා විසින් මෙම සභාවට ඉදිරිපත් කර ඇති බවත්, එම මුදල මෙම අයවැයට සඳහන් මුදලක්ද යන වගට ප්‍රශ්නය නගමින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින්, එම යෝජනාව මෙම අයවැයට සම්බන්ධ නැති බවත්, මේ වන විට සභාවේ ජංගම ගිණුම්වල මුදල් අතිරික්තයක් ඇති බවත්, අද දිනයේදීද රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් මුද්දර ගාස්තු ලෙස සභාවට ලැබෙන බවත්, එම නිසා රුපියල් කෝටි අටකට ආසන්න මුදලක් සභාවේ ජංගම ගිණුම්වල පවතින නිසා සහ සංවර්ධන කටයුතු වලට කොටස් වශයෙන් ගෙවීම් කරන නිසාත්, රුපියල් කෝටි පහක මුදලක් කෙටිකාලීනව රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට එම යෝජනාව ඉදිරිපත් කල බවත්, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් මිල ගණන් කැඳවා මේ සඳහා සුදුසු බැංකුව තෝරාගන්නා බවත්, මෙම සභාවාරය ආරම්භ කරන විට සභාවේ මූල්‍ය තත්ත්වය අයහපත් තත්ත්වයක තිබුණ නමුත් මේ වන විට සිදුකරන ලද සංවර්ධන කටයුතු වලට අමතරව රුපියල් කෝටි අටකට ආසන්න මුදලක් සභාවේ ජංගම ගිණුම්වල ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් අදහස් දක්වමින්, අදවන විට සභාවේ අඩුපාඩු රාශියක් ඇති බවත්, වීදි පහන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වීදි පහන් මේ වන විට නොමැති බවත්, කොට්ඨාශවල සංවර්ධන කටයුතු සඳහා මෙම අයවැයෙන් මුදල් වෙන් කරන ලෙසත්, මාර්ගයන් දෙපස පවිත්‍රතා කටයුතු සඳහා අවශ්‍ය තණකොළ කපන යන්ත්‍ර පවා මේ වනවිට සභාවේ නොමැති බවත්, බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොවූ ප්‍රදේශ ඇති බැවින්, සභා අරමුදල් වලින් බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදුකිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින්, 2022 වර්ෂයේ අයවැය මගින් වීදි පහන් කටයුතු සඳහා රුපියල් ලක්ෂ හතළිහක මුදලක් වෙන් කල බවත්, වීදි පහන් නඩත්තුව සඳහා අවශ්‍ය විදුලි උපාංග වල මිල ඉහළයාම නිසා මෙම ප්‍රශ්නය පැන නැගුණ බවත්, අධිබල එල්.ඊ.ඩී වීදි පහන් දෙසීයක් පමණද මෙම වර්ෂයේදී මිලදී ගත් බවත්, වැය ශීර්ෂ හරහා මුදල් මාරුකොට තවත් වීදි පහන් ප්‍රමාණයක් මිලදීගත් බවත්, ලබන වර්ෂයේදී නව වීදි පහන් කට්ටල මිලදී නොගෙන පවතින වීදි පහන් අළුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බවත්, 2023 වර්ෂයේ ජනවාරි මස සිට කොට්ඨාශවල සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ විස්සක මුදලක් ලබා දිය හැකි බවත්, රුපියල් කෝටි පහක මුදල අවුරුද්දක කාලයක් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යාමට හැකි වුවහොත් රුපියල් කෝටි එකහමාරක පමණ මුදලක් පොළී වශයෙන් ලබා ගැනීමට හැකි බවත්, එම මුදල් සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට හැකි බවත්, තණකොළ කපන යන්ත්‍ර සඳහා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමට තිබෙන අපහසුතාවයන් නිසා මාර්ගයන් දෙපස පවිත්‍රතා කටයුතු සඳහා තණකොළ කපන යන්ත්‍ර යෙදවීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් තණකොළ කපන යන්ත්‍ර සඳහා අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමට තමාට මැදිහත් විය හැකි බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් අදහස් දක්වමින් 2023 වර්ෂය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනයට තමා විසින් සුභ පැතුම් එක් කරන බවත්, ශ්‍රී ලංකාවේ අයවැය ලේඛනය යනු හුදෙක් සංඛ්‍යාත්මක එකතුවක් පමණක් වන බවත්, පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල අයවැය ලේඛන වල සංඛ්‍යා දක්වා දෙපැත්ත

සමබර කිරීමට ලක් කළද මුළු ඉතිහාසයේම අයවැය ලේඛන වලින් අපේක්ෂිත ඉලක්ක කරා ගමන්කොට නොමැති බවත්, එම නිසා උපකල්පිත සංඛ්‍යා මත පදනම් කොට ගෙන පක්ෂවීම හා විපක්ෂවීම නිරූපනය කිරීමක් සිදුකරන බවත්, 1965 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ ණයවැයක් මිස අයවැයක් ඉදිරිපත් වී නොමැති බවත්, එම නිසා බලාපොරොත්තු වන ආදායම් සහ වියදම් නොලැබී අඩු වැඩි වීම් සිදුවන බවත්, මෙම අයවැය ඉදිරිපත් කරන අද දිනයේදී සභාවට මුද්දර ගාස්තු වශයෙන් විශාල මුදලක් ලැබෙන බවට සුභ ආරංචියක් ගරු සභාපතිතුමා වෙතින් දැන ගැනීමට ලැබුණ බවත්, පාස්කු ප්‍රහාරය සහ කොරෝනා උවදුරෙන් පසු රටේ පැවතුණු තත්ත්වය මත ගම්වල සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණ බවත්, එම නිසා ප්‍රාදේශීය දේශපාලඥයින් ලෙස ගරු සභිකවරු අපහසුතාවයට ලක් වූ බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාද මේ වන විට සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවන බවත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදන හරහාද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවුන බවත්, පළාත් සභාව හරහා පළාත් නිශ්චිත ප්‍රදාන මගින්ද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවුන බවත්, සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවීම නිසා බල ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයන්ට ලක්ව සිටින බවත්, මෙම අයවැයේ 19වන පිටුවේ සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ තුන්සියයක මුදලක් වෙන්කර ඇති බවට සඳහන් බවත්, පසුගිය වර්ෂයේ අයවැයෙන්ද මෙවැනිම මුදලක් සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ බවත්, ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල අසීමිත ලෙස වැඩිවීම නිසා ඉදිකිරීම් කටයුතු අඩාල වී ඇති බවත්, පසුගිය වර්ෂය වන විට මාර්ගයක් මීටර් 100ක් දුරට මීටර් 2.4ක් පළලට කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ පහක පමණ මුදලක් වැයවූ නමුත් අද වන විට එම ප්‍රමාණයට මාර්ගයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ දහයක පමණ මුදලක් අවශ්‍ය බවත්, එම නිසා රුපියල් ලක්ෂ විස්සක මුදලකින් සංවර්ධනය කිරීමට හැකියාව ඇත්තේ මාර්ග මීටර් 200ක පමණ දුරක් බවත්, එම නිසා කොට්ඨාශ සංවර්ධනය සඳහා ලබා දෙන මුදල වැඩි කිරීමට අවධානය යොමුකළ යුතු බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම වර්ෂයේ දෙසැම්බර් මස වන විට කොට්ඨාශවල සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ විස්සකට අදාළව යෝජනා ඉදිරිපත් කොට ඇස්තමේන්තු සකස්කර ජනවාරි මස වන විට අදාළ සංවර්ධන කටයුතු සිදුකිරීමට කටයුතු කරන බවත්, අද දිනය වන විටද සභාව කිසිදු ආයතනයක් වෙත ණය නොමැති බවත්, මෙම වර්ෂයේදී කෝටි පහහමාරකට ආසන්න මුදලක් මුද්දර ගාස්තු සහ උසාවි දඩ වශයෙන් ලැබුණ බවත්, ඉදිරි වර්ෂයේදී ඊට වඩා වැඩි මුදලක් සභාව වෙත මුද්දර ගාස්තු වශයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත්, ලබන වර්ෂයේ කොට්ඨාශ සංවර්ධනය සඳහා වෙන් කරන රුපියල් ලක්ෂ විස්සක මුදල අවසන් වූ පසු නැවත වරක් කොට්ඨාශ සංවර්ධනය සඳහා මුදල් ලබා දීමට හැකියාව ඇති බවත්, සභාවට ලැබෙන අදායම සලකා බලා පරිපූරක අයවැයක් ඉදිරිපත් කොට එම කාර්යය සිදු කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ පරිදි මෙම සභා වාරය තුළ ඉදිරිපත් කරනු ලබන අවසාන අයවැය මෙය විය හැකි බවට තමා විශ්වාස කරන බවත්, මෙම අයවැය සම්මත කර ගැනීමට මහා සභා රැස්වීමටම ඉදිරිපත් කර තිබීම තමා හට ගැටළු සහගත බවත්, සභාවේ ඇති අතිරික්ත මුදලක් ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කිරීමට ගනු ලැබූ තීරණය වැරදි නොවන බවත්, සභා අරමුදලින් 60% ක් දක්වා සංවර්ධන යෝජනාවන් සඳහා වියදම් සීමා කොට තිබීම නිසා සභාවේ බහුතර එකඟත්වය තිබුණද ඇතැම් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති බවත්, අයවැයේ සමස්ථය රුපියල් දාහතර කෝටි විසිලක්ෂ පනස්දහසක ඉලක්කයක් බවත්, සභාවක් ලෙස බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු කාර්යයන් මෙම වැය ශීර්ෂයන් යටතේ ඉටු කරන බවත්, මෙය ප්‍රදේශයේ ජනතාවට බලපාන වැදගත් කොටසක් බවත්, මෙම වර්ෂයේ අයවැයෙන් සිට්ටුස්වත්තේ ආදාහනාගාරය සහ කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් කෝටි එකොළහකට ආසන්න මුදලක් වෙන්කොට ඇති බවත්, මෙම සංවර්ධන යෝජනා දෙක සිදුකරන්නේ මුළු බල ප්‍රදේශයම වෙත වුවද, බල ප්‍රදේශයේ ජනතාව වෙත බලපාන මාර්ග, කාණු ඉදිකිරීම සහ වීදි පහන් නඩත්තු කටයුතු මේ වන විට ගැටළු සහගත තත්ත්වයක පවතින බවත්, කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් සහ සිට්ටුස්වත්තේ අදාහනාගාරය ඉදිකිරීම යන කාරණා දෙකට අමතරව බලප්‍රදේශයේ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා වෙන්කොට ඇත්තේ රුපියල් තුන්කෝටි විසිපන් ලක්ෂයකට ආසන්න මුදලක් බවත්, එය සමස්ථ අයවැයෙන් 10% - 12%ක පමණ මුදලක් බවත්, සමස්ථ අයවැයෙන් බල ප්‍රදේශයේ ජනතාව වෙත සෘජුව බලපාන කරුණු සඳහා වෙන්කොට ඇත්තේ 10% - 12%ක පමණ මුදලක් බවත්, වැටුප් යනු පුනරාවර්තන වියදමක් වන බැවින් එය ගැටළුවක් නොමැති බවත්, මෙම අයවැයෙන් ප්‍රදේශයේ ජනතාව වෙත සෘජුව බලපාන කරුණු සඳහා දායකත්වය දැක්විය හැක්කේ 10% - 12%ක පමණ මුදලක් බැවින් ඒ පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බවත්, පොදු උපයෝගිතා සේවා යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් හාර කෝටි අනූපන් ලක්ෂයක මුදලක් වෙන්කොට ඇති බවත්, ඊට අමතරව වීදි පහන් නඩත්තු කටයුතු සඳහා රුපියල් ලක්ෂ තිහක මුදලක් වෙන්කොට ඇති බවත්, සෞඛ්‍යය සඳහා වෙන්කරන ලද මුදල් වලින් විශාල ප්‍රමාණයක් වෙන්කොට ඇත්තේ සිට්ටුස්වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා බවත්, ප්‍රාග්ධන වැය වලින් ප්‍රධාන කරුණු කාරණා වලට වෙන්කල පසු සංවර්ධන කටයුතු

සඳහා 10% - 12%ක පමණ මුදලක් වෙන්කර ඇති බවත්, භෞතික සැලසුම් සහ මංමාවත් නඩත්තු කටයුතු සඳහා රුපියල් තුන්කෝටි එක්ලක්ෂයක් වෙන්කොට ඇති බවත්, ඒ යටතේ රුපියල් කෝටි තුනක මුදලක් ප්‍රාග්ධන වැය යටතේ වෙන්කොට ඇති බවත්, එම නිසා තමන් මෙම අයවැයට විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් වියදම අවම කර ගැනීම සඳහා මෙම අයවැය මහා සභා රැස්වීමටම ඉදිරිපත් කළ බවත්, වීදි පහන් නඩත්තු කටයුතු සඳහා රුපියල් ලක්ෂ තිහක මුදලක් මෙම අයවැය මගින් වෙන්කොට ඇති බවත්, ජේ.සී.බී යන්ත්‍රය භාවිතය, කසළ කලමනාකරණ කටයුතු, වීදි පහන් නඩත්තු කටයුතු ඇතුළු සේවාවන්ද ප්‍රදේශීය සභාව මගින් ඉටු කරන බවත්, ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුත්ත සහා අරමුදලේ 60% සීමාව ඉක්මවා යන නිසා ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමුකොට ඇති බවත්, අයවැයෙන් වැඩිම මුදලක් වෙන්කොට ඇත්තේ වැටුප් හා දීමනා ගෙවීමට බවත්, බෝපෙ පෝද්දල බල ප්‍රදේශය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් ඇති අතර එය ස්වාධීන ආයතනයක් බවත්, ජේ.සී.බී. යන්ත්‍රය සහ සභාවේ කම්කරුවන් යොදවා සිදුකරනු ලබන පවිත්‍රතා කටයුතු සඳහාද සභා අරමුදලින් වියදම් දරන බවත්, එම කාර්යයන් සිදුකරනු ලබන්නේ සෞඛ්‍ය කටයුතු සඳහා අයවැය මගින් වෙන්කරන මුදල් වලට අමතරව බවත්, අයවැය සකස්කරන අවස්ථාවේදී එහි කටයුතු සඳහා සාධනීය ලෙස සහභාගි වූ ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ ඉල්ලීම පරිදි පුස්තකාල සඳහා සහ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රමාණය වැඩි කල බවත්, සභාවෙන් මූලිකව ප්‍රාග්ධන වැය සඳහා වෙන්කරන ලද මුදල් වලට අමතරවද කටයුතු කිරීමට සිදුවන බවත්, කසළ කලමනාකරණය, කාණු පද්ධති සුද්ධ පවිත්‍ර කිරීම වැනි කටයුතුද සිදුකරන බවත්, 2023 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුගත කිරීමේදී පෙර වර්ෂවල මුදල් වියදම් වූ ආකාරය පිළිබඳව සලකා බලන බවත්, ඊට අමතරව සභාවට ලැබිය යුතු ආදායම් තත්ත්වයද සලකා බලන බවත්, මාර්ග සංවර්ධනයට අමතරව ප්‍රීමික්ස් ව්‍යාපෘතිය සඳහාද මුදල් වෙන්කර ඇති බවත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ආරම්භකළ පසු සංවර්ධනය කළ යුතු මාර්ග ප්‍රමාණය අඩුවන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් අදහස් දක්වමින් 2023 අයවැයට තමා සුභපතන බවත්, මීට පෙර සභාවාර වලදී අයවැය සභා සම්මත කර ගැනීමට හිටපු ගරු සභාපතිවරුන් හට වැඩි වෙහෙසක් දැරීමට සිදුවූ බවත්, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු අතරද අයවැය සම්බන්ධව එම සභා වාර වලදී එකඟතාවයක් නොතිබුණ බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය හතරටම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් බාධා ඇති නොවුන බවත්, එය ගරු සභාපතිතුමාගේ හැකියාවක් බවත්, ගරු සභිකවරුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව සොයා බැලීම ගරු සභාපතිතුමාගේ වගකීමක් බවත්, ගරු සභිකවරුන්ට ඇති ගැටළු සම්බන්ධව සොයා බලා අවශ්‍ය සහයෝගය ලබාදීම ගරු සභාපතිතුමාගේ යුතුකමක් බවත්, 2023 වර්ෂයේදී ගරු සභිකවරුන්ගේ ඉල්ලීම් සඳහා ගරු සභාපතිවරයා විසින් විශේෂ අවධානයක් යොමුකල යුතු බවත්, ගරු සභිකවරුන්ගෙන් සංවර්ධන යෝජනා ලබාගෙන 2023 වර්ෂයේ ජනවාරි මස වන විට ඒවා ක්‍රියාත්මක කළ යුතු බවත්, වීදි පහන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය විදුලි උපාංග මිලදී ගැනීම සඳහා මෙම වර්ෂය අවසාන වන විටම මිල ගණන් කැඳවිය යුතු බවත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කල යුතු බවත්, සේවක මහත්වරු හට අවශ්‍ය අඩුපාඩුව ඇති කම්කරු උපාංගද මිලදීගෙන ලබා දිය යුතු බවත්, තණකොළ යන්ත්‍ර සඳහා අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමටද කටයුතු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ මුදල් ඉතිරි කළා යැයි ප්‍රකාශ කළද, මේ වන විට පළාත් සභාව ක්‍රියාත්මක නොවන නිසා ආණ්ඩුකාරතුමා යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබිය යුතු මුද්දර ගාස්තු ලැබෙන බවත්, මීට පෙර ප්‍රාදේශීය සභාවලට ලැබිය යුතු මුදල් වලින් පළාත් සභා නඩත්තු වූ බවත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ආරම්භකොට මාර්ග අළුත්වැඩියා කළ විට මාර්ග සංවර්ධන කටයුතු සඳහා වැයවන මුදල් ප්‍රමාණය අඩුවන බවත්, සිට්ටුස්වත්තේ ආදාහනාගාරය ඉදිකිරීමට කැඳවූ පළමු ටෙන්ඩරය අනුව කටයුතු කරා නම් එම ආදාහනාගාරය අදවන විට ඉදිකර ගැනීමට හැකියාව තිබූ බවත්, සිට්ටුස්වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරයට ප්‍රවාහන පහසුකම් සපයාගැනීමට අපහසු බවත්, මහා සභාව ප්‍රාදේශීය සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස ක්‍රියාකල යුතු වුවද මෙම සභාව එසේ ක්‍රියාත්මක නොවන බවත්, එම හේතු නිසා තමන් මෙම අයවැයට විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මුද්දර ගාස්තු ලබා ගැනීමට ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු බවත්, පළාත් සභාව මහ ඇමතිතුමා යටතේ ක්‍රියාත්මක වන විට මුද්දර ගාස්තු ලබා ගැනීමට ඉල්ලීම් කළද එම මුදල් ලබා ගැනීමට අපහසු බවත්, වර්තමාන දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා හට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ විට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුද්දර ගාස්තු ලබාගත හැකි බවත්, මෙම වර්ෂය තුලදී අතිකාල දීමනා ගෙවීම සහ අනෙකුත් වියදම් දැරීම සීමා කිරීම නිසා රුපියල් කෝටි අටක පමණ මුදලක් මේ වන විට ඉතිරිකොට ඇති බවත්, 2023 වර්ෂය සඳහා අදාළ අයවැය සභා සම්මත කිරීමට ඉදිරිපත්කරන ලද යෝජනාවට විරෝධතා ඉදිරිපත් වූ බැවින් මෙම යෝජනාව සභා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන බවත් ප්‍රකාශ කරන ලදී.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි වේ.

පක්ෂව - 11

විපක්ෂව - 10

ඡන්දය දීමෙන් වැළකී සිටි - 01

**ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
10. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා ඡන්දය භාවිතා නොකළ ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

එම යෝජනාව වැඩි ඡන්ද 01 කින් සභා සම්මත වූ බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**සභා සම්මුතිය ඃ-** 2023 වර්ෂය සඳහා අදාළ අයවැය මහා සභාව විසින් බහුතරයෙන් සභා සම්මත කරන ලදී.

**(පෙ.ව 11.40ට තේ පානය සඳහා කල් තබන ලද සභාව ප.ව 12.10ට නැවත ආරම්භ කරන ලදී.)**

(සභාව තේ පානය සඳහා කල් තබන ලද කාලය තුළ දී පෙ.ව 11.50ට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**02.** 2022-11-01 වන දින සිට නීතිඥ ගාස්තු ගෙවීම, ඡායාපිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම වෙනුවෙන් 2022 වර්ෂයේ අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ඌනතාවයක් ඇතිවූ බැවින් අතිකාල දීමනා ගෙවීම, ගමන් වියදම් ගෙවීම, නිල ඇඳුම් දීමනා සහ දුරකථන දීමනා ගෙවීම වෙනුවෙන් අතිරික්ත වූ වැය විෂයන් වලින් පහත සඳහන් පරිදි වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට යෝජනා කරමි.

| ඌනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 105-9-1 | වෙනත් වියදම් | රු.500,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 50,000.00 |
| 103-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 130,000.00 | 202-1 | ගමන් වියදම් | 50,000.00 |
| 107-1 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 15,000.00 | 103-3 | නිල ඇඳුම් | 25,000.00 |
| | එකතුව | 645,000.00 | 105-1 | වෙනත් ආවශ්‍යක සේවා - ප්‍රවාහන | 30,000.00 |
| | | | 105-2 | සම්බන්ධතා සේවා - දුරකථන බිල් | 50,000.00 |
| | | | 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000.00 |
| | | | 203-3 | නිල ඇඳුම් | 30,000.00 |
| | | | 205-3-1 | වෙනත් ආවශ්‍යක සේවා - දුරකථන | 25,000.00 |
| | | | 303-3 | නිල ඇඳුම් | 85,000.00 |
| | | | 305-9 | වෙනත් වියදම් | 100,000.00 |
| | | | 501-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 50,000.00 |
| | | | 501-9 | වෙනත් දීමනා | 50,000.00 |
| | | | | එකතුව | 645,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** 2022-11-01 වන දින සිට නීතිඥ ගාස්තු ගෙවීම, ඡායාපිටපත් යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම වෙනුවෙන් 2022 වර්ෂයේ අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ඌනතාවයක් ඇතිවූ බැවින් අතිකාල දීමනා ගෙවීම, ගමන් වියදම් ගෙවීම, නිල ඇඳුම් දීමනා සහ දුරකථන දීමනා ගෙවීම වෙනුවෙන් අතිරික්ත වූ වැය විෂයන් වලින් පහත සඳහන් පරිදි වැය ශීර්ෂයන් අතර මුදල් මාරු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| ඌනතා වූ වැය විෂයන් | | | අතිරික්ත වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) | වැය සංකේතය | වැය විෂය | වටිනාකම (රු.) |
| 105-9-1 | වෙනත් වියදම් | රු.500,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 50,000.00 |
| 103-1 | සැපයුම් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 130,000.00 | 202-1 | ගමන් වියදම් | 50,000.00 |
| 107-1 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 15,000.00 | 103-3 | නිල ඇඳුම් | 25,000.00 |
| | එකතුව | 645,000.00 | 105-1 | වෙනත් ආවශ්‍යක සේවා - ප්‍රවාහන | 30,000.00 |
| | | | 105-2 | සම්බන්ධතා සේවා - දුරකථන බිල් | 50,000.00 |
| | | | 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000.00 |
| | | | 203-3 | නිල ඇඳුම් | 30,000.00 |

| | | |
|---|---|---|
| 205-3-1 | වෙනත් ආවශ්‍යක සේවා - දුරකථන | 25,000.00 |
| 303-3 | නිල ඇඳුම් | 85,000.00 |
| 305-9 | වෙනත් වියදම් | 100,000.00 |
| 501-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 50,000.00 |
| 501-9 | වෙනත් දීමනා | 50,000.00 |
| | එකතුව | 645,000.00 |

**03.** හපුගල, මොල්ලිගොඩවත්ත ප්‍රධාන මාර්ගයේ, සරසවි අසපුව, 07 වන පටුමග ආරම්භක ස්ථානය පෙට්ටි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් කාපට් යොදා සංවර්ධනය කරන ලද මාර්ගයේ බෝක්කුවක් අවහිරවී ඇති බවත්, එම ස්ථානයට යොදා ඇති සිලින්ඩරයක් ඇතුලෙන් කැඩී ඇති බවත්, එම නිසා මෙම ස්ථානයේ ඇති අතුරු මාර්ගය සඳහා බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කළ බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** හපුගල, මොල්ලිගොඩවත්ත ප්‍රධාන මාර්ගයේ, සරසවි අසපුව, 07 වන පටුමග ආරම්භක ස්ථානය පෙට්ටි බෝක්කුවක් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** හපුගල, සෙන්ට් රීටාස් පාරේ බෝක්කුව අසළ පැති බැම්ම සහ කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ගැටළුව ඇත්තේ කලේගාන කොට්ඨාශයේ බවත්, එම කාර්යය සෘජු ශ්‍රමික පදනම මත සිදු කිරීමට හැකියාවක් නොමැති නිසා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** හපුගල, සෙන්ට් රීටාස් පාරේ බෝක්කුව අසළ පැති බැම්ම සහ කාණුව සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 12.15 ට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**05.** දකුණු පළාතේ, පළාත් පාලන ආයතන සහ දකුණු පළාත් භාණ්ඩාගාරය අතර මුද්දර ගාස්තු වැනි හිඟ ආදායම් ශේෂයන් සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමට පත් කරන ලද කමිටුවේ නිර්දේශ අනුව 2022-09-15 දින දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පවත්වන ලද රැස්වීමේදී 2022-06-30 දිනට දකුණු පළාත් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන මුද්දර ගාස්තු ශේෂයන් අප ප්‍රාදේශීය සභාවේ ශේෂයන් සමඟ පරීක්ෂා කරන ලද අතර එම සාකච්ඡාවේදී එකඟ වූ පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2022-10-31 දිනැති CSS/8/4/3/-2022 අංක දරණ ලිපියේ සඳහන් සිදුකල යුතු ගැලපීම් අනුව අප ප්‍රාදේශීය සභාවේ හිඟ මුද්දර ගාස්තු ආදායම් ශේෂය නිවැරදි කර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් පසුගිය වර්ෂ කිහිපයක මුද්දර ගාස්තු සභාව වෙත නොලැබුණ බවත්, ඉදිරියේදීද එම මුද්දර ගාස්තු නොලැබෙන බවත්, එම නිසා ආයතන දෙකෙහි පොත්වල ගිණුම් ශේෂයන් නිවැරදි කර ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** දකුණු පළාතේ, පළාත් පාලන ආයතන සහ දකුණු පළාත් භාණ්ඩාගාරය අතර මුද්දර ගාස්තු වැනි හිඟ ආදායම් ශේෂයන් සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමට පත් කරන ලද කමිටුවේ නිර්දේශ අනුව 2022-09-15 දින දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පවත්වන ලද රැස්වීමේදී 2022-06-30 දිනට දකුණු පළාත් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන මුද්දර ගාස්තු ශේෂයන් අප ප්‍රාදේශීය සභාවේ ශේෂයන් සමඟ පරීක්ෂා කරන ලද අතර එම සාකච්ඡාවේදී එකඟ වූ පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2022-10-31 දිනැති CSS/8/4/3/-2022 අංක දරණ ලිපියේ සඳහන් සිදුකල යුතු ගැලපීම් අනුව අප ප්‍රාදේශීය සභාවේ හිඟ මුද්දර ගාස්තු ආදායම් ශේෂය නිවැරදි කර ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා හදිසි කාර්යයක් සඳහා මහා සභා රැස්වීමෙන් බැහැරව ගිය බැවින් ගරු උප සභාපතිතුමාගේ යෝජනාව තමා විසින් ඉදිරිපත් කරනු ලබන බවට ප්‍රකාශ කරන ලදී.

**06.** කපුහෙම්පල, අම්බලම කන්ද ප්‍රදේශයට නල ජලය ලබාදීමේ ව්‍යාපෘතියේ ජල නල එලීම සඳහා කාණු කැපීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කපුහෙම්පල, අම්බලම කන්ද ප්‍රදේශයට නල ජලය ලබාදීමේ ව්‍යාපෘතියේ ජල නල එලීම සඳහා කාණු කැපීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ලබාදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමාගේ යෝජනා</u>**

**07.** උළුවිටිකේ, ලිද්දෙණිවත්තේ, යූ.ජී. පියසේන මහතාගේ නිවස අසළ වතුර බැසයාමට නොහැකි පරිදි පස් පුරවා අවහිර කර ඇති ස්ථානයේ කාණුවක් කපා වතුර බැසයාමට හැකිවන පරිදි සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ගැටළුව නිසා පියසේන මහතාගේ කකුල තුවාල වී රෝහල්ගතව නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමට පවා සිදුව ඇති බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් එම ස්ථානයේ කාණුවක් සකස්කිරීම පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් නිර්දේශ ලබා ගැනීමට යොමුකර ඇති බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** උළුවිටිකේ, ලිද්දෙණිවත්තේ, යූ.ජී. පියසේන මහතාගේ නිවස අසළ වතුර බැසයාමට නොහැකි පරිදි පස් පුරවා අවහිර කර ඇති ස්ථානයේ කාණුවක් කපා වතුර බැසයාමට හැකිවන පරිදි සකස්කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** උළුවිටිකේ, ලිද්දෙණියවත්තේ, සිරිමල් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයට අවහිර ලෙස පිහිටා ඇති කොස් ගස් සහ අනෙකුත් ගස් කපා මාර්ගය සකස්කර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් කාණු පද්ධතිය සමග මෙම ගස් ඉවත්කර මාර්ගය සුද්ධ පවිත්‍ර කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** උඩුවිටිකේ, ලිද්දෙණියවත්තේ, සිරිමල් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයට අවහිර ලෙස පිහිටා ඇති කොස් ගස් සහ අනෙකුත් ගස් කපා මාර්ගය සකස්කර දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**</u>

**09.** පාලිත අමරවර්ධන මහතාගේ පවුලේ සුසාන භූමියට යන මාර්ගයේ පිහිටි අප සභාව මගින් කපා පටවාගෙන එන ලද කොස් ගස සභාවට ගිය වියදම් අයිතිකරුගෙන් අයකර ගැනීමෙන් පසු හිමිකරු වන අමරවර්ධන මහතාගේ අයිතිය තහවුරු කරගෙන ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින්, එම ඉඩමට තවත් හිමිකරුවන් සිටින්නේ නම් කොස්ගසෙ අයිතිය සම්බන්ධව මේ වන විට ඉදිරිපත් විය යුතු බවත්, එබැවින් මෙම කොස්ගසට තවත් හිමිකරුවන් සිටී නම් ඉදිරිපත් වන ලෙස එම ඉඩමේ දැන්වීම් ඇලවිය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් එම කොස්ගස පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉල්ලා සිටි බවත්, ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමුකර ඇති බවත්, එම ඉඩමට පාලිත අමරවර්ධන මහතා වෙත ඇත්තේ ප්‍රවේශතා අයිතියක් පමණක් බවත්, මෙම ගැටළුව පිළිබඳව තමා විසින් නීතිඥ උපදෙස් ලබා ගත් බවත්, ප්‍රවේශතා අයිතිය යනු හිමිකමක් හෝ අයිතියක් හෝ නොවන බවත් එම නිසා නැවත අධිකරණය වෙත ගොස් ප්‍රවේශතා අයිතිය ඉවත් කර ගත යුතු බවට තමාව දැනුවත් කළ බවත්, මෙම ඉඩම සම්බන්ධව මායිම් ආරවුලක් ඇති බවත්, එම නඩුවෙන් මෙම ඉඩමට ලබාදී ඇති ප්‍රවේශතා අයිතිය ඉවත් කර ගත යුතු බවත්, එම කොස් කොටන් සභාවට ගෙන ඒමේ වගකීම තමා විසින් දරණ බවත්, එම කොස් කොටන් ටික තවමත් සභා පරිශ්‍රයේ ඇති බවත්, එම කොස් කොටන් ටික නියම අයිතිකරු තහවුරු කරගෙන සභාවට වැයවූ මුදල් ලබා ගැනීමෙන් පසු නිදහස් කරන බවත්, මෙම ප්‍රශ්නය විසඳීමට තමා මැදිහත් වන බවත්, මෙම කාර්යයේදී සභාව නොමග යවා සභා අරමුදලින් කොස් ගස කපා කොටන් ටික ලබා ගැනීමට උත්සාහයක් දැරුව බවත්, මෙම ගැටළුව පිළිබඳව දිසාපතිතුමා සමග සාකච්ඡාකොට විසඳුමක් ලබාදෙන බවත්, මෙම ගැටළුවේදී කිසිදු පාර්ශවයක් හට අසාධාරණයක් සිදු නොවන පරිදි කටයුතු කරන බවත්, දිසාපතිතුමා මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන්නේ නැතිනම් මෙම කොස් ගසට හිමිකරුවන් ඉදිරිපත්වන ලෙස එම ඉඩමේ දැන්වීම් පළකොට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් අදහස් දක්වමින් කොට්ඨාශ මන්ත්‍රීවරයා මේ සම්බන්ධව වගකීම ගන්නා බවට ලිපියක් ලබාගෙන කොස්ගස කැපීම සඳහා වැයවූ මුදල් ලබා ගෙන කොස් කොටන් ටික එම කොස්ගස සඳහා හිමිකම් කියනු ලබන පුද්ගලයා වෙත ලබා දිය හැකි බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** පාලිත අමරවර්ධන මහතාගේ පවුලේ සුසාන භූමියට යන මාර්ගයේ පිහිටි අප සභාව මගින් කපා පටවාගෙන එන ලද කොස් ගස සභාවට ගිය වියදම් අයිතිකරුගෙන් අයකර ගැනීමෙන් පසු හිමිකරු වන අමරවර්ධන මහතාගේ අයිතිය තහවුරු කරගෙන ලබාදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**10.** හිරිඹුරගම සුභ සාධක ගොඩනැගිල්ලේ වහල අබලන් කොටස අළුත්වැඩියා කර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ගොඩනැගිල්ලේ අයිතිය ඇත්තේ සභාවට බවත්, එය සභා අරමුදලින් දෙවරක් අළුත්වැඩියා කොට ඇති බවත්, එම ඉඩමේ සභාවේ සුමුදු පෙර පාසල ඉදිකර ඇති බවත්, එම ඉඩමේ අයිතිය පිළිබඳ විස්තර ඇතුළත් ලිපිගොනුවක් තමා සතුව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** හිරිඹුරගම සුභ සාධක ගොඩනැගිල්ලේ වහල අබලන් කොටස අළුත්වැඩියා කර දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** උඩවිටිකේ, ලිද්දෙණිය වත්ත මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර ඇති තාප්පය හේතුවෙන් මාර්ගය අවහිර වී ඇති බැවින් එම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ៖-** උඩවිටිකේ, ලිද්දෙණිය වත්ත මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර ඇති තාප්පය හේතුවෙන් මාර්ගය අවහිර වී ඇති බැවින් එම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** බංගලාවත්ත, විශාකා මහත්මියගේ නිවසට හානිකර අයුරින් ඉදිකර ඇති අනවසර ගල් බැම්ම ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ៖-** බංගලාවත්ත, විශාකා මහත්මියගේ නිවසට හානිකර අයුරින් ඉදිකර ඇති අනවසර ගල් බැම්ම ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** හිරිඹුර ගැමුණු මාවතේ සභාව සතු පොදු ළිඳ ඇතුලට දමන ලද පස් සභාවේ බැකෝ යන්ත්‍රය යොදාගනිමින් ඉවත් කොට පොදු ළිඳ නැවත පිළිසකර කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් එම ස්ථානයේ වටිනා ගල් ඇති බවත්, එම ගල් දමා ළිඳ වසා ගොඩකර ඇති බවත්, දැනට එම ස්ථානයේ ළිඳක් නොමැති බවත්, මේ වන විට එම ළිඳෙහි ඇති උල්පත මාර්ගයෙන් මතුව ඇති බවත්, එම ළිඳ ඉදිරිපිට ඇති ඉඩමේ සැලැස්මේ ළිඳ පිහිටි බිම් කොටස පිළිබඳව සඳහන්ව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එම ඉඩමේ අයිතිය තහවුරු කර ගෙන එම ඉඩමේ වැට කම්බි ගැසිය යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ៖-** හිරිඹුර ගැමුණු මාවතේ සභාව සතු පොදු ළිඳ ඇතුලට දමන ලද පස් සභාවේ බැකෝ යන්ත්‍රය යොදාගනිමින් ඉවත් කොට පොදු ළිඳ නැවත පිළිසකර කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**14.** ගැමුණු මාවත ප්‍රධාන මාර්ගයේ ගමන් කළ නොහැකි ආකාරයට උල්පතක් මතුවීම නිසා වළක් සෑදී ඇති බැවින් එම මාර්ගයේ ගමනාගමන කටයුතු වලට අපහසුතා මතුව ඇති බැවින් මාර්ගය සුදුසු පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ៖-** ගැමුණු මාවත ප්‍රධාන මාර්ගයේ ගමන් කළ නොහැකි ආකාරයට උල්පතක් මතුවීම නිසා වළක් සෑදී ඇති බැවින් එම මාර්ගයේ ගමනාගමන කටයුතු වලට අපහසුතා මතුව ඇති බැවින් මාර්ගය සුදුසු පරිදි සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**15.** කරාපිටිය, පන්විලදූව වත්තේ දීර්ඝකාලීන ගැටළුවක්ව පවතින කාණු පද්ධතිය පී.වී.සී නල යොදා හෝ කාණුවක් සකසා හෝ විසඳා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම මාර්ගයේ ඇති සියළු නිවාස වර්ෂා කාලයේදී ජලයෙන් යටවන බවත්, මෙම මාර්ගයේ සියළුම නිවාස හිමියන් ගැටළුව විසඳා ගැනීමට එකඟතාවය පළකොට ඇති බවත්, ගැටළුකාරී ස්ථානය පැවති නිවස මේ වන විට විකුණා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මේ පිළිබඳව තමා විසින් කිහිපවතාවක්ම ස්ථානීය පරීක්ෂණයක් සිදුකළ නමුත් අදාළ සියළුම පාර්ශවයන්ගේ එකඟතාවය ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම ගැටළුව විසඳීමට නොහැකි වූ බවත්, මෙම ගැටළුව නැවත තාක්ෂණ නිලධාරී වෙත යොමු කොට විසඳීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කරාපිටිය, පන්විලදූව වත්තේ දීර්ඝකාලීන ගැටළුවක්ව පවතින කාණු පද්ධතිය පී.වී.සී නල යොදා හෝ කාණුවක් සකසා හෝ විසඳා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**16.** ගල්කැටියවත්ත, සමගි මාවතේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ගල්කැටියවත්ත, සමගි මාවතේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**17.** ගොඩකන්ද මැදපාර (කජ්ජුගහ වත්ත මාර්ගය) හියුම් පයිප්ප යොදා වාහන ගමන්කළ හැකි ආකාරයට සංවර්ධනය කරදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ගොඩකන්ද මැදපාර (කජ්ජුගහ වත්ත මාර්ගය) හියුම් පයිප්ප යොදා වාහන ගමන්කළ හැකි ආකාරයට සංවර්ධනය කරදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**18.** ගොඩකන්ද, කරාපිටිය මාර්ගයේ මනිලාල් බේකරිය අසළ හැල්පැන්දලවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කරදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ගොඩකන්ද, කරාපිටිය මාර්ගයේ මනිලාල් බේකරිය අසළ හැල්පැන්දලවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කරදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**19.** ගොඩකන්ද, මනෝජ් හාඩ්වෙයාර් එක අසළ ඇළ මාර්ගය සභාවේ සේවකයන් සහ යන්ත්‍ර සූත්‍ර භාවිතා කොට සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඉල්ලීමක් අනුව මෙම කාණුව සුද්ධ පවිත්‍ර කිරීම සඳහා සභාවේ සේවකයන් ගොස් ඇති නමුත් ඒ සඳහා විරෝධතා ඉදිරිපත් වී ඇති බැවින් පොලීසිය, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ද කැඳවා මෙම කාර්යය සිදුකල යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ගොඩකන්ද, මනෝජ් හාඩ්වෙයාර් එක අසළ ඇළ මාර්ගය සභාවේ සේවකයන් සහ යන්ත්‍ර සූත්‍ර භාවිතා කොට සුද්ධ පවිත්‍ර කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 12.35ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>**

**20.** අප ප්‍රාදේශීය සභාවේ අතිකාල ලබන සියළුම තනතුරුවල කාර්ය මණ්ඩලයේ නාම ලේඛනය සහ ඔවුන්ගේ පත්වීම් ස්වාභාවය අනුව නියමිත රාජකාරි වේලාවන් සහ එක් එක් අයෙකු සඳහා අනුමත කර ඇති අතිකාල පැය ගණන ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සභාගතකොට මා වෙත පිටපතක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් අදහස් දක්වමින් අද දින න්‍යායපත්‍රයේද අතිකාල දීමනා වලට සම්බන්ධව මුදල් මාරු කිරීමක් සිදුකළ බවත්, ගරු සභාපතිතුමා විසින් අතිකාල දීමනා ගෙවීම සීමාකොට මුදල් ඉතිරි කළ බවට සභාව දැනුවත් කළ බවත්, සභාවේ ඇතැම් සේවකයන්හට සෙනසුරාදා සහ ඉරිදා දිනවල වැඩ නොමැතිවීම හේතුවෙන් අතිකාල දීමනා නොලැබෙන බවත්, ආර්ථික ප්‍රශ්න නිසා සේවකයන් හට එය ගැටළුකාරි බවට ප්‍රකාශ කරන බවත්, එම නිසා අතිකාල දීමනා සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීමට මෙම යෝජනාව ඉදිරිපත් කල බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් සේවකයන්හට ඇති ආර්ථික ගැටළුවලට අතිකාල දීමනා ගෙවීම අදාළ නොවන බවත්, වැඩ වැඩිපුර තිබේ නම් අතිකාල දීමනා ගෙවීම සාධාරණ බවත්, රටතුළ ඉන්ධන හිඟයක් පැවති කාලසීමාවේදී සතියකට දින තුනක් පමණක් සේවය කොට සතියේ වැඩ ප්‍රමාණය ආවරණය කළ හැකි බවට ප්‍රකාශ කළ සේවකයන් හට දැන් එම කාර්යය සතියේ දින පහ තුළ සිදුකල හැකි බවත්, ඒ සඳහා සෙනසුරාදා සහ ඉරිදා සේවය කිරීමට අවශ්‍ය නොවන බවත්, අත්‍යාවශ්‍යම සේවකයන් පමණක් නිවාඩු දිනවල සේවයට කැඳවන බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** අප ප්‍රාදේශීය සභාවේ අතිකාල ලබන සියළුම තනතුරුවල කාර්ය මණ්ඩලයේ නාම ලේඛනය සහ ඔවුන්ගේ පත්වීම් ස්වාභාවය අනුව නියමිත රාජකාරි වේලාවන් සහ එක් එක් අයෙකු සඳහා අනුමත කර ඇති අතිකාල පැය ගණන ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සභාගතකොට මා වෙත පිටපතක් ලබා දෙන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් අදහස් දක්වමින් අද දින න්‍යාය පත්‍රයට තමා විසින් ලබා දුන් යෝජනා තුන අතරින් යෝජනා දෙකක් ගරු සභාපතිතුමා විසින් ඉවත්කරන බවට දැනුම් දුන් බවත්, ලේකම්තුමාගේ කොන්ත්‍රාත් සේවා කාලය මෙම වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීමට අදාළව සභාව විසින් අනුමත කළ බවත්, නමුත් ලේකම්තුමා නොවැම්බර් මස 23 වන දින කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කොට විශ්‍රාම යන බවට දැනුම් දී ඇති නිසා වෙනත් නිලධාරියෙකු ඒ සඳහා පත්කරගැනීමට අවශ්‍ය බැවින් සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරියාව ඒ සඳහා යෝජනා කරමින් තමා යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ඇති බවත්, මොල්ලිගොඩවත්ත මාර්ගයේ ඇති අනතුරුදායක තත්ත්වය පිළිබඳව තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවද ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රයෙන් ඉවත්කොට ඒ සම්බන්ධව ජලසම්පාදන මණ්ඩලය වෙත සභාවේ අවසරයකින් තොරව නලජල අළුත්වැඩියා කටයුතු සඳහා මාර්ගය පළුදු නොකරන ලෙස දැනුම් දෙන බවටත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ආරම්භ කළ පසු එම අඩුපාඩු සම්පූර්ණ කරන බවටත් දැනුවත් කළ නමුත්, මෙම මාර්ගයේ කාණු පද්ධතිය අවදානම් තත්ත්වයේ පවතින බවත්, එම කාණු අසළ මාර්ගය ගිලා බැස ඇති බවත්, මාර්ගය අසන්නයටම කණ්ඩි කපා තිබීමද අනතුරුදායක බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින්, ලේකම් පත්කිරීමේ කාර්යය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් සිදුකළ යුතු කාර්යයක් බවත්, ගරු ආණ්ඩුකාරතුමාට පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසා සේවා අවශ්‍යතාවය මත ලේකම්තුමාගේ කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝකිරීමට හැකියාවක් ඇති බවත්, සභාවෙන් මේ සම්බන්ධව යෝජනාවක් අනුමත කළද ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කොට නැවත අනුමත කරගත යුතු බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ වන විට පරිපාලන නිලධාරීන් දොළොස් දෙනෙකු බඳවාගෙන ඇති නමුත් එම නිලධාරීන් තවම ප්‍රාදේශීය සභාවන් වෙත යොමුකොට නැති බවත්, ගරු සභාපතිවරු විසින් මෙම සභාවාරය අවසන් වන තෙක් දැනට සිටින ලේකම්වරු ඉවත් නොකරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලීම්කර ඇති බැවින් එම පත්වීම් ලබාදීම ප්‍රමාද කොට ඇති බවත්, ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් මාර්ගය පළුදු කර ඇති ස්ථාන දෙක මේ වන විට පස්වලින් වැසී ඇති බවත්, එම වළවල් දෙක අළුත්වැඩියා කරන ලෙස ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කර ඇති බවත්, එම නිසා එහි වගකීම සභාව විසින් භාරගත යුතු නැති බවත්, මාර්ගය දෙපස පස් දමා ගොඩකර තිබූ නමුත් මේ වන විට වර්ෂාව නිසා එම පස් සෝදා ගොස් ඇති බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම මාර්ගයේ කාණුව සඳහා ස්ලැබ් කැලි යෙදිය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් එම කාණුව සඳහා කිලෝමීටරයක් පමණ දුරට කොන්ක්‍රීට් ස්ලැබ් කැලි යොදන්නේ නම් එය සභා අරමුදලන් සිදුකළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව :-**

**I.** 2022-11-03 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අදහස් දක්වමින් කමිටු වාර්තා යතුරු ලියනය කොට ඉදිරිපත්කර නොතිතිබීම හේතුවෙන් මෙම කමිටු වාර්තාවට විරුද්ධ බවට ප්‍රකාශ කරන ලදී.

එම වාර්තාව බහුතරයෙන් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව :- නැත**

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත**

(ප.ව 12.55ට ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාගර්භයෙන් පිටවීම සිදුවිය.)

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**ඉ. විශේෂ 01.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ගිණුම්වල රු.63,070,667.81 ක මුදල් ජංගම ගිණුම්වල ඇති බැවින් එම මුදල් සභාවට වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රජයේ බැංකුවක මිල ගණන් ලබා ගැනීමෙන් පසු වැඩි වාර්ෂික පොළී අනුපාතයකට කෙටි කාලීන ස්ථිර තැන්පතුවක රුපියල් මිලියන 50ක මුදලක් තැන්පත් කිරීමට යෝජනා කරමි.

| ගිණුම් අංකය | ගිණුම | 2022-10-31 දිනට ශේෂය |
|---|---|---|
| 0000400935 | පොදු ගිණුම | රු.32,929,906.00 |
| 003528344 | කර්මාන්ත ගිණුම | රු.30,140,761.81 |
| | එකතුව | රු.63,070,667.81 |

න්‍යාය පත්‍රයේ සඳහන් නොවූ ඉහත විශේෂ යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින්, මෙම මුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතුවක රජයේ බැංකුවක ආයෝජනය කිරීමට යෝජනා කළ බවත්, මේ වන විට කෙටි කාලීන ස්ථාවර තැන්පතු සඳහා දිගු කාලීන ස්ථාවර තැන්පතු වලට වඩා වැඩි පොලියක් ගෙවන බවත්, ලංකා බැංකුව, මහජන බැංකුව, සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා මිල ගණන් කැඳවා මුදල් කමිටුව මගින් සුදුසු බැංකුව තෝරාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් අදහස් දක්වමින් කෙටිකාලීන ලෙස සඳහන් වුවද මෙම යෝජනාවේ කාලසීමාව නිශ්චිත නොවන නිසා මාස තුනක කාලයක් ලෙස මෙම යෝජනාව සංශෝධනය කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ගිණුම්වල රු.63,070,667.81 ක මුදල් ජංගම ගිණුම්වල ඇති බැවින් එම මුදල් සභාවට වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රජයේ බැංකුවක මිල ගණන් ලබා ගැනීමෙන් පසු වැඩි වාර්ෂික පොළී අනුපාතයකට මාස තුනක ස්ථිර තැන්පතුවක රුපියල් මිලියන 50ක මුදලක් තැන්පත් කිරීමට යෝජනා කරමි ලෙස ඉහත විශේෂ යෝජනාවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් කරන ලද සංශෝධනය ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| ගිණුම් අංකය | ගිණුම | 2022-10-31 දිනට ශේෂය |
|---|---|---|
| 0000400935 | පොදු ගිණුම | රු.32,929,906.00 |
| 003528344 | කර්මාන්ත ගිණුම | රු.30,140,761.81 |
| | එකතුව | රු.63,070,667.81 |

එම සංශෝධිත විශේෂ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ගිණුම්වල රු.63,070,667.81 ක මුදල් ජංගම ගිණුම්වල ඇති බැවින් එම මුදල් සභාවට වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රජයේ බැංකුවක මිල ගණන් ලබා ගැනීමෙන් පසු වැඩි වාර්ෂික පොළී අනුපාතයකට මාස තුනක ස්ථිර තැන්පතුවක රුපියල් මිලියන 50ක මුදලක් තැන්පත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

| ගිණුම් අංකය | ගිණුම | 2022-10-31 දිනට ශේෂය |
|---|---|---|
| 0000400935 | පොදු ගිණුම | රු.32,929,906.00 |
| 003528344 | කර්මාන්ත ගිණුම | රු.30,140,761.81 |
| | එකතුව | රු.63,070,667.81 |

<u>(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>

**<u>පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය</u>**

**<u>2022 වර්ෂයේ නොවැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.</u>**

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම මේ වන විටත් ඉදිකර ගැනීමට නොහැකි වූ බවත්, මේ සම්බන්ධව තමා විසින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙතින් පවා කිහිප වතාවක් විමසීම් කළ බවත්, එම පැති බැම්ම හැකි ඉක්මණින් ඉදිකර මාර්ගයේ ආරක්ෂව තහවුරු කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් අදහස් දක්වමින් කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවත්, එම ස්ථානය ඉදිරිපිට ඇති බස් නැවතුම අසළ පොළක් ලෙස

වෙළඳාම් කටයුතු සිදු කිරීම සඳහා භාවිතා කිරීමෙන් මාර්ගයේ වාහන ගමනාගමනයට සහ බස්රථ නැවැත්වීමට බාධා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 12.35ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අදහස් දක්වමින් හේනවත්ත ප්‍රදේශයේ නායයෑමේ තත්ත්වයක් මතුව ඇති බවත්, ජීවිත හානි සිදු නොවූවද නිවාස දෙකකට ඉන් හානි සිදුවී ඇති බවත්, එම ස්ථානයේ ඇති දුරකථන කුළුණ ඉදිකරන ලද්දේ අවට ප්‍රදේශවාසීන් හට නල ජලය ලබා දෙන ලෙස පවසා බවත්, මේ වන විට එම දුරකථන කුළුණ ඇලවී ඇති බවත්, හපුගල බටුවන්තුඩාව පන්සල ඉදිරිපිට වෙන්දේසි ඉඩමේ නායයෑමක් සිදුව ඇති බවත්, එම වෙන්දේසි ඉඩමේ වතුර ගලා යාමට ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැති බවත්, එම වෙන්දේසි ඉඩමේ ඇති නිවාස මේ වන විට අනතුරුදායක තත්ත්වයක ඇති බවත්, හේනවත්ත ප්‍රදේශයේ අනතුරුදායක ලෙස පස් කන්දක් කපන බවත්, ඒ සඳහා අවසර ලබාගෙන ඇත්නම් එම කාර්යය සිදුකරන ආකාරය අධීක්ෂණය කළ යුතු බවත්, නරාවල, කාසල්වත්තේ අනුර රණධීර මහතාගේ නිවස අසල පස් කණ්ඩිය කැපීමේ ගැටළුව විසඳීම සඳහා මාර්ගය මැනීමට මැනුම් නියෝගයක් ලබාගත යුතු බවත්, එම ස්ථානයේ පස් බැම්ම කැපීමට තිබුණේ මාර්ගය මැනීමෙන් පසුව බවත්, අනවසර ඉදිකිරීමක් ඇති ස්ථානයක වුවද එම ඉදිකිරීමට හානි නොවන පරිදි පස් බැම්ම කැපිය යුතු බවත්, වටරැක ප්‍රදේශයේ මෙවැනි පස් බැම්මක් කපන ලද්දේ කම්කරුවන් යොදාගෙන බවත්, මෙම පස් බැම්ම මගින් අනතුරක් සිදු වුවහොත් එහි වගකීම සභාවට පැවරෙන බවත්, එම නිසා මෙම කාර්යය කඩිනමින් සිදුකරදෙන ලෙස හෝ නැතිනම් අනතුරක් සිදුවුවහොත් එහි වගකීම භාරගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දිය යුතු බවත්, රිචඩ් පතිරණ හිටපු අමාත්‍යතුමා වක්වැල්ල පාලම ඉදිකොට ගම් දෙකක් යා කල බවත්, එම නිසා ඕපාත මාර්ගයද සංවර්ධනය කිරීමට මැදිහත් වන ලෙසත්, බල ප්‍රදේශයේ අතුරු මාර්ග පවා කාපට් යොදා සංවර්ධනය කොට ඇති බවත්, මෙම සභා වාරය පැමිණ මේ වන විට වසර පහක් ගත වුවද ඕපාත මාර්ගය සංවර්ධනය කර ගැනීමට නොහැකි වූ බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් කුඹුරු ඉඩම් ගොඩකිරීමට අදාලව පවරන නඩු වලින් පරාද වන බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් නඩු පවරා පරාජය වූ සියළුම නඩු සඳහා නැවත අභියාචනය කරන ලෙස ඉල්ලීම් කරන ලෙසත්, මේ වන විට වර්ෂා කාලයේදී වක්වැල්ල මාර්ගය හපුගල හන්දියේ සිට අපේගම හන්දිය දක්වා ජලයෙන් යටවන බවත්, හපුගල ප්‍රදේශය මේ වන විට අනවසර ඉදිකිරීම් කලාපයක් බවට පත්ව ඇති බවත්, එම ගැටළු සම්බන්ධව ගරු සභාපතිතුමා පසුගිය සභා වාරයේදී ලබාදුන් පිළිතුරු සම්බන්ධව තමා සෑහීමකට පත් නොවන බවත්, නමුත් ඒ සම්බන්ධව ලබාගත යුතු සභා සම්මුතියන් සඳහා යෝජනා තමා විසින් ලබා දෙන බවත්, අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරිය යුතු බවට ගරු සභිකවරුන් විසින් යෝජනා ඉදිරිපත් කළ යුතු නැති බවත්, එය වැරදි පූර්වාදර්ශයක් බවත්, එය නිලධාරීන් විසින් සිදුකළ යුතු බවත්, මෙම සභාවාරයට එම අනවසර ඉදිකිරීම් සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීමට තමා බලාපොරොත්තුවෙන් සිටියද, තමා කොළඹ ප්‍රදේශයේ සිටි බැවින් එය සිදුකරගැනීමට නොහැකි වූ බවත්, එම නිසා ඊට අදාළ යෝජනා මෙම අවස්ථාවේදී ඉදිරිපත් කරන බවත්, අනවසර ඉදිකිරීම් සඳහා නිලධාරීන් විසින් රාජකාරි කටයුතු සිදුකොට ඇති බවත්, ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සභාවට ඉදිරිපත් කළ පසු සභාව විසින් ඒ සම්බන්ධ අනුමැතිය ලබාදෙන බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින්, නරාවල, කාසල්වත්තේ මාර්ගය සඳහා මැනුම් නියෝගය ලබාදෙනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් බවත්, මානව හිමිකම් කොමිෂන් සභාවේදී තමා එම ගැටළුකාරී ස්ථානයේ පැති බැම්ම ඉදිකරදීමට පොරොන්දු වූ බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් මාර්ගයේ නිවැරදි මායිම් පෙන්වාදීමෙන් පසු ඒ ස්ථානයේ නිවැරදි මායිම දක්වා පස් බැම්ම කපා පැති බැම්ම ඉදිකිරීමට බලාපොරොත්තු වන බවත්, එම මාර්ගය මැනීමෙන් පසු පස් බැම්ම කපන ලද බවත්, එම ස්ථානයේ නිවැරදි මායිම නිවස ආසන්නයට ආසන්නව ඇති බැවින් පස් බැම්ම තව කැපිය යුතු බවත්, එම මැනුම ලබා ගැනීම සඳහා තමා මැදිහත් වන බවත්, අනුර රණධීර මහතා පදිංචි නිවස අනවසර ඉදිකිරීමක් බවත්, ඉඩමේ අයිතිය එම පුද්ගලයාට නොමැති බවත්, එම ඉඩමේ මේ වන විටත් තවත් අනවසර ඉදිකිරීමක් සිදුකරන බවත්, මිහිඳු මාවත සහ ඕපාත මාර්ගය යන මාර්ගයන් දෙක කාපට් යොදා සංවර්ධනය කර දෙන ලෙස දැනුම් දී ඇති බවත්, මේ සඳහා ඇස්තමේන්තු සකස්කොට, ටෙන්ඩර් කැඳවා, ගිවිසුම් අත්සන්කොට, කොන්ත්‍රාත් පිරිනමා ඇති නමුත් රටතුළ ඇති ආර්ථික ගැටළු නිසා මෙම මාර්ග සංවර්ධනය ප්‍රමාද වන බවත්, හපුගල, දහනායක හාඩ්වෙයාර් එක පිහිටි භූමිය ගොඩකිරීම සම්බන්ධව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් පවරන ලද නඩුව පරාජය වී ඇති බවත්, හපුගල පන්සල අසළ සිට අපේගම දක්වා අවහිර කර ඇති කාණු කැඩීමට සහභාගි වී සහාය දක්වන ලෙසත්, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ලබා ගැනීමට අවශ්‍ය නම් විධිමත් සභා යෝජනාවක් ඉදිරිපත් කොට සභා සම්මුතියක් ලබාගත යුතු බවත්, නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අනවසර ඉදිකිරීම් සඳහා විධිමත් සභා සම්මුතියක් ලබාගත යුතු බවත්, මෙම යෝජනා ඊළඟ සභා වාරයට ඉදිරිපත් කරන බවත්, යම් අනවසර ඉදිකිරීමක් නිවැරදි කර ගැනීමට ඉල්ලා සිටි විට ඒ සඳහා අවස්ථාව ලබාදිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 01.05ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, සහ ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් අදහස් දක්වමින් ඕපාත මාර්ගය සංවර්ධනය කිරීමට තමා මැදිහත් වන බවත්, ටෙන්ඩර් කැඳවා, ගිවිසුම් අත්සන්කොට, කොන්ත්‍රාත් පිරිනමා ඇති නමුත් රටතුළ ඇති ආර්ථික ගැටළු නිසා මෙම මාර්ග සංවර්ධනය ප්‍රමාද වන බවත් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 01.15ට ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය අවසතු කරන ලද ඉඩමට ලබාදී තිබූ සංවර්ධන බලපත්‍රය අවලංගු කිරීමට අදාළව අශෝක කුලරත්න මහතා සභාව වෙත පවරා ඇති නඩුව මෙම මස 29 වන දින පැවැත්වෙන බැවින් ඊට පෙර සභාව වෙනුවෙන් පෙනී සිටින නීතිඥතුමා හමුවී සාකච්ඡා කිරීමට ගරු සභිකවරුන්හට අවස්ථාව ලබාදිය හැකි බවත්, එබැවින් එම අවස්ථාව ලබා ගන්නා ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> :- නැත (සියළුම ගරු සභිකවරු මහා සභා රැස්වීමට සහභාගි විය)**

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-12-21 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 01.20 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,<br>
සභාපති,<br>
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.